**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ මැලේරියා නව මූල්‍යයන ආකෘතිය සංරචකය -2017**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ මැලේරියා නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල අතර 2016 පෙබරවාරි 29 දින එළඹි අංක 898-එල්කේඒ-එම්-එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුමේ 13(ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරයි. ශ්‍රී ලංකාවේ දැනට දැඩි මැලේරියා පීඩාවකින් බලපෑමට ලක් වී සිටින ශ්‍රී ලංකාවේ ගැටුම්වල බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කවල මායිම් ප්‍රදේශවල ජීවත්වන ජනතාව අතර දැඩි මැලේරියා පාලනය සඳහා කටයුතු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ප්‍රදාන ගිවිසුම අනුව, නව මූල්‍යයන ආකෘතිය යටතේ දැඩි මැලේරියා පාලනය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 921.28 කට සමාන එජඩො මිලියන 7.05 ක් වන අතර, සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර, 2018 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන්  පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 මූල්‍ය කාර්යසාධනය

ඉකුත් වර්ෂයේ වියදමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා දරන ලද වියදම හා 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ විස්තර පහත සාරාංශ කෙරේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | | | 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|---|
| | 2017 | | 2016 | | |
| | එජඩො | රු. | එජඩො | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 672,527 | 101,760,132 | 220,794 | 33,920,523 | 343,410,626 |
| මැලේරියා පාලන කටයුතු | 1,765,608 | 269,180,284 | 991,446 | 147,745,226 | 1,714,396,816 |
| | 2,438,135 | 370,940,416 | 1,212,240 | 181,665,749 | 2,057,807,442 |

### 2.2.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2016 සහ 2017 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|---|---|
| | එජඩො | රු. | එජඩො | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | | |
| විදේශ ආධාර වලින් ලද මුදල් ප්‍රදාන | 1,828,565 | 278,764,789 | 886,875 | 132,162,100 |
| දේශීය අරමුදල්වලට අදාළ විදේශ ආධාර | 409,970 | 62,500,000 | 15,359 | 2,288,839 |
| 08 වන වටයෙන් ලැබුණු මුදල වැය 13 | 8,619 | 1,314,000 | - | - |
| ටෙන්ඩර් ආදායමෙන් ලැබුණු මුදල් | 164 | 25,000 | 54 | 8,000 |
| වැඩසටහන් වියදම් සඳහා ගෙවන ලද මුදල් | (1,765,608) | (269,180,284) | (991,446) | (147,745,226) |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | 481,710 | 73,423,505 | (89,158) | (13,286,288) |
| ක්ෂය | 253,859 | 38,411,411 | 270,121 | 40,253,371 |
| ගෙවිය යුතු ශේෂ වැඩිවීම | (342,527) | (53,088,451) | 492,429 | 75,651,863 |
| ලැබිය යුතු ශේෂ වැඩිවීම | 284,261 | 44,018,656 | (434,086) | (66,688,699) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 6,138 | 928,810 | (7,474) | (1,113,732) |
| විනිමය හුවමාරු වෙනස | 1,905 | - | (5,026) | - |
| වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික | (3,260) | (493,337) | (6,012) | (895,992) |
| මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් | 682,086 | 103,200,594 | 220,794 | 33,920,523 |

**ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය**
**---------------------------------------------**

| | | | | |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් | (672,527) | (101,760,131) | (220,794) | (33,920,523) |
| ආයෝජන කටයුතුවල යොදාගත් ශුද්ධ මුදල් | (672,527) | (101,760,131) | (220,794) | (33,920,523) |

**මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය**
**---------------------------------------**

| | | | | |
|---|---|---|---|---|
| භාණ්ඩාගාරයට ආපසු යැවූ මුදල් | (9,559) | (1,440,463) | - | - |
| මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් | (9,559) | (1,440,463) | - | - |
| මුදල් ශුද්ධ වැඩිවීම/ ශුද්ධ අඩුවීම | නැත | නැත | නැත | නැත |

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ මැලේරියා නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ කාර්යයන් 2016 ජනවාරි 01 සිට ආරම්භ කර තිබුණද, පෙර ව්‍යාපෘතිය විසින් 2015 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 210.80 කට ප්‍රසම්පාදනය කර රේඛීය අමාත්‍යාංශයට භාරදෙන ලද දේපල, පිරියත හා උපකරණ ව්‍යාපෘතියේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා රජය විසින් රු.මිලියන 62.50 ක මුදලක් දායක වී තිබුණද, ගිණුම්කරණ දෝෂයක් හේතුවෙන් රු.මිලියන 61.06 ක මුදලක් ශ්‍රී ලංකා රජයේ දායකය ලෙස ආදායම් ප්‍රකාශනයට ගෙන තිබුණි.

### 2.2.4 නොසැසඳූ ශේෂ
**--------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය තොරතුරු මහා භාණ්ඩාගාරය විසින් පවත්වා ගෙන යන ලද වාර්තා සමඟ සැසඳීම සඳහා ව්‍යාපෘති නියාමන ඒකකය කටයුතු කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාලෝචිත වර්ෂය සඳහා කරන ලද රු.මිලියන 72.27 කට සමාන එජඩො 474,055 ක සෘජු වියපැහැදම භාණ්ඩාගාර වාර්තාවල සටහන් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 2.2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
**-----------------------------------------------------**

මුදල් රෙගුලාසි 371(5) හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, අවස්ථා 45 කදී රු.100,000 ක උපරිම සීමාව ඉක්මවා එකතුව රු.මිලියන 8.78 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. තවද, අවස්ථා 11 කදී ලබා දෙන ලද එකතුව රු.744,950 ක් වූ අතුරු අග්‍රිම දින 11 සිට මාස 05 දක්වා කාල පරිච්ඡේදයක ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි. ඊට අමතරව, අදාළ කාර්යය සඳහා ඉතාම ආසන්න දිනයේදී තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ මාස 1 ½ සිට මාස 10 දක්වා වූ නියමිත දිනට පෙර අවස්ථා 14 කදී එකතුව රු.910,175 ක අතුරු අග්‍රිම ලබා දී තිබුණි.

## 4. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---

### 4.1 අරමුදල් උපයෝජනය

---

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, වර්ෂය තුළදී ලැබුණු අරමුදල් හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය කිරීම සඳහා එකඟවූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 7.05 | 921.28 | 5.20 | 1.80 | 278.00 | 2.61 | 398.65 |
| ශ්‍රී ලං ර | - | - | - | 0.40 | 61.06 | 0.40 | 61.06 |
| එකතුව | 7.05 | 921.28 | 5.20 | 2.20 | 339.06 | 3.01 | 459.71 |

ව්‍යාපෘති ලියකියවිලි අනුව, 2016 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 921.28 කට සමාන එජඩො මිලියන 7.05 ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 වන විටත් රු.මිලියන 398.65 කට සමාන එජඩො මිලියන 2.61 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, ගෝලීය අරමුදලින් ප්‍රතිපූර්ණය කරන ලද රු.මිලියන 20.32 ක උපයෝජනය නොකරන ලද ශේෂයක් 2017 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයේ පැවතුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

---

මැලේරියා සංරචකයේ ප්‍රගති යාවත්කාලීන හා වියපැහැදම් ඉල්ලීම් වාර්තා අනුව, 2017 වර්ෂය සඳහා අයවැය පිරිවැය වර්ග 13 ක් මඟින් ක්‍රියාත්මක කිරීමට අයවැය සීමා කාර්යයන් 183 ක් සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල අයවැය සීමා කාර්යයන් 11 ක් ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස, රු.මිලියන 19.78 කට සමාන එජඩො 151,350 ක වෙන්කිරීම් උපයෝජනය කර නොතිබුණි. ඊට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අයවැය සීමා කාර්යයන් 73 ක භෞතික ප්‍රගතිය ගණනය කර 2017 දෙසැම්බර් 31 දිනට වාර්තා කර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**
**-------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ මැලේරියාව නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ (NFM) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට වෙනම විගණන වාර්තාවක් නිකුත් කර තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ඒ සඳහා විගණකාධිපතිවරයාගේ එකඟතාවය ඉල්ලා නොතිබුණි.

(ආ) රු.මිලියන 58 ක පිරිවැයකට වූ මෝටර් වාහන 06 ක් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසම්පාදනය කර තිබූ බවත්, ඒ සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 22.20 ක මුදලක් පමණක් වෙන්කර තිබූ බවත් නිරීක්ෂණය විය. ඉතිරි මුදල වන රු.මිලියන 35.80 සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ එකඟතාවය සහිතව ශ්‍රී ලංකා රජය විසින් දායක වී තිබුණි. තවද, උතුරු හා නැගෙනහිර පළාත් වෙනුවට දිවයිනේ ප්‍රදේශ සඳහා මෝටර් වාහන බෙදාහැරීමට, ප්‍රදාන නියෝජිතායතනය ඉල්ලා තිබුණු අතර අදාළ මෝටර් වාහන උතුරු පළාතේ කිලිනොච්චි, මුලතිව්, කල්මුණේ හා ඌව පළාතේ මොණරාගල හා බදුල්ල සහ වයඹ පළාතේ කුරුණෑගල යන ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අනුයුක්ත කර තිබුණි. කෙසේ වුවද, මෝටර් වාහන ප්‍රසම්පාදනය කිරීමට අදාළ ලිපිගොනු හා වෙනත් ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**
**--------------------------------**

වැඩසටහන් සම්බන්ධීකාරකවරු දෙදෙනෙකු, මහජන සෞඛ්‍ය රසායනික තාක්ෂණිකවරයෙකු, ප්‍රාදේශීය දත්ත පිවිසුම් ක්‍රියාකරුවන් තිදෙනෙකු, මයික්‍රස්කොපි මැලේරියා සහායකවරුන් 15 දෙනෙකු හා රෝගකාරක පරපෝෂිත පාලන සහායකවරුන් (Vector Control) 11 දෙනෙකු වර්ෂ 02 කට වැඩි කාලයක් පුරප්පාඩු වී පැවතුණු අතර ව්‍යාපෘතියේ සරල මෙහෙයුම් සඳහා ඉතා විශාල ලෙස එම පුරප්පාඩු බලපා තිබුණද පුරප්පාඩු පිරවීම සඳහා 2017 දෙසැම්බර් 31 දක්වා පියවර ගෙන නොතිබුණි.

**3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු**
**------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) රු.මිලියන 345.11 කට සමාන එජඩො මිලියන 2.28 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.